මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය -2020

----------------------------------------

මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2017 ඔක්තෝබර් 04 දින එළඹි අංක 6006 දරන මූල්‍යකරණ ගිවිසුමේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

--------------------------------------------------------------------------------

මූල්‍යකරණ ගිවිසුමට අනුව, මුදල් අමාත්‍යාංශය ව්‍යාපෘතියේ විධායක නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ පුද්ගලයන් අතර මූල්‍ය වෙළෙඳපොළ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ මූල්‍ය සේවා භාවිතය ඉහළ නැංවීම සඳහා දායක වීමයි. මූල්‍යකරණ ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 13,125 කට සමාන එජඩො මිලියන 75 ක් වන අතර මුළු මුදලම මූල්‍යකරණය කිරීමට අන්තර්ජාතික සංවර්ධන සංගමය (IDA) එකඟ විය. ව්‍යාපෘතියේ කටයුතු 2018 ඔක්තෝබර් 18 දින ආරම්භ කර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දින වන විට එහි කටයුතු අවසන් කිරීමට නියමිතව තිබුණි.

## 1.3 මතය

------

2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

--------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** භෞතික කාර්යසාධනය

**2.1** ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| සංරචකය | 2020 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණය | ප්‍රමාදයන් සඳහා හේතු |
|---|---|---|---|---|
| | අපේක්ෂිත භෞතික කාර්යසාධනය | අත්පත් කරගත් කාර්යසාධනය | | |
| | ඒකක | ඒකක | | |
| සංරචකය - 01 | 13 මුදල් ගෙවීම සම්බන්ධ ප්‍රතිඵල (DLR) | 03 මුදල් ගෙවීම සම්බන්ධ ප්‍රතිඵල | ව්‍යාපෘති ඇගයුම් ලේඛනයට අනුව, 2019 දෙසැම්බර් 31 දිනට ලබා ගැනීමට සැලසුම් කරන ලද මුදල් ගෙවීම හා සම්බන්ධිත ප්‍රතිඵල 10 ක් එම දිනය වන විට සාක්ෂාත් කර ගෙන නොතිබුණි. කෙසේ වෙතත්, 2020 අප්‍රේල් මස මූල්‍ය ගිවිසුමට සිදු කරන ලද සංශෝධනයට අනුව, මෙම මුදල් ගෙවීම හා සම්බන්ධිත ප්‍රතිඵල අත්පත් කර ගන්නා වර්ෂය 2021 වර්ෂය වශයෙන් සංශෝධනය කර ඇත. | ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය |
| සංරචකය - 02 | නියාමන ආයතන තුනක සංවිධාන ධාරිතාව ශක්තිමත් කිරීම | - | නියාමකයින්ගේ සංවිධානාත්මක ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා වූ ප්‍රසම්පාදන කටයුතුවල ප්‍රමාදය හේතුවෙන් සංරචකය 02 යටතේ, එහි ප්‍රගතිය දුර්වල විය. | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදය. |

කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම — සංරචකය 02 යටතේ ඇති බොහෝ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් 2021 වසර තුළ අවසන් කර ප්‍රදානය කිරීමට අපේක්ෂා කරන බැවින් 2021 වසර තුළ නිම කිරීමට අපේක්ෂිතය.

විගණකගේ නිර්දේශය — අපේක්ෂිත සියලු ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය.

## 2.2 භාවිත නොකළ සම්පත්

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් වෙනුවෙන් අයවැය ඇස්තමේන්තුව මගින් සමාලෝචිත වර්ෂය සඳහා වෙන් කර තිබූ මුළු ප්‍රතිපාදනය වූ රු. මිලියන 430.3 ක් අතරින් සියයට 17 ක් නියෝජනය කරන රු. මිලියන 74.96 ක මුදලක් පමණක් ව්‍යාපෘතිය මගින් උපයෝජනය කර තිබුණි. | නියමිත පරිදි මුදල් ගෙවීම හා සම්බන්ධිත ප්‍රතිඵල සාක්ෂාත් කර නොගැනීම සහ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදයන් සහ රට තුළ පවතින කොවිඩ් වසංගතය හේතුවෙන් වෙන් කළ ප්‍රතිපාදන අපේක්ෂිත පරිදි ප්‍රයෝජනයට ගැනීමට නොහැකි විය. | අපේක්ෂිත පරිදි සියලු ඉලක්ක සපුරා ගැනීමට සහ වෙන් කරන ලද අරමුදල් උපරිම ලෙස උපයෝජනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ආ) | ව්‍යාපෘතියේ සම්පූර්ණ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 13,125 කට සමාන වන එජඩො මිලියන 75 ක් වේ. ව්‍යාපෘතිය ආරම්භ කර වසර දෙකක් ගත වුවද, 2020 දෙසැම්බර් 31 දින වන විට මුළු ණය උපයෝජනය රු. මිලියන 577.11 ක් වන අතර එය ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැයෙන් සියයට 4 ක් පමණි. | මුදල් ගෙවීම සම්බන්ධිත ප්‍රතිඵල 10 ක් 2021 වර්ෂයේදී සාක්ෂාත් කර ගැනීමට සැලසුම් කර ඇති අතර, සංරචක 02 යටතේ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් බොහොමයක් 2021 වර්ෂයේදී අවසන් කර ප්‍රදානය කිරීමට බලාපොරොත්තු වන බැවින්, එම ගෙවීම් උපයෝජනය කිරීම මගින් 2021 වර්ෂයේ උපයෝජනය සැලකිය යුතු අන්දමින් ඉහළ නැංවීමට හැකි වනු ඇත. | වෙන් කර ඇති මුළු මුදල් උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. |